# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| | |
|---|---|
| නිකුත් කළේ | විදේශ විනිමය දෙපාර්තමේන්තුව |
| දිනය | 2021.04.16 |

## අපනයනය මගින් ලද මුදල් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම

භාණ්ඩ අපනයන කරුවන්ගෙන් ලද ඉල්ලීම් සළකා බලා 2021.03.09 දින ප්‍රසිද්ධ කරන ලද අංක 2218/38 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය, මුදල් මණ්ඩලය විසින් පහත පරිදි සංශෝධනය කරන ලදී.

(අ) භාණ්ඩ අපනයන ආදායම ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීමේ අනිවාර්ය අවශ්‍යතාවය සියයට විසිපහ (25) සිට සියයට දහය (10) දක්වා අඩු කිරීම, සහ

(ආ) ඉහත (අ) අවශ්‍යතාවය අනුව, භාණ්ඩ අපනයන ආදායම ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීම සඳහා ලබා දී තිබූ කාලය, දින දහහතර (14) සිට දින තිහ (30) ක් දක්වා දීර්ඝ කිරීම. කෙසේ වෙතත්, එම පරිවර්තනය කරන දිනය, නැව්ගත කළ දින සිට දින එකසිය අසූවකට (180) පසු දිනයක් නොවිය යුතුය.

වැඩි විස්තර සඳහා 2021.04.09 දිනැති අංක 2222/60 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ 2021 රීති අංක 3 වෙත යොමු වන්න. (http://www.documents.gov.lk/files/egz/2021/4/2222-60_S.pdf)